## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය - 2017

-----------------------------------------------------------------

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2006 අංක 23 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනතින් සංශෝධිත 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරී පනතේ 25 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම්, අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ අධිකාරිය වෙත ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබී තිබූ රු.1,003,000,000 ක් හා විවිධ ආයෝජන ව්‍යාපෘති වෙනුවෙන් වැයකල රු.1,002,985,802 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03

ප්‍රමිතයෙහි 12 ඡේදය ප්‍රකාරව ගණුදෙනුවක් වෙනත් සිදුවීමක් හෝ තත්ත්වයන් කෙරෙහි ව්‍යවහාර වන නිශ්චිත ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියක් නොමැතිවිට කළමනාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් නිර්මාණය කර ව්‍යවහාර කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය වෙත භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන රු.172,350,000 ක් හා පුනරාවර්තන ප්‍රදාන රු.343,050,000 ක් හා අමාත්‍යාංශයෙන් සහ වෙනත් රජයේ ආයතන වලින් ප්‍රදාන ලෙස ලැබී තිබූ රු.1,236,510,000 ක් ගිණුම්ගත කිරීම සඳහා වූ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර රු.343,050,000 පුනරාවර්තන ලැබීම් ඍජු ආදායමක් ලෙස හඳුනාගැනීම වෙනුවට වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

(i) ප්‍රමිතයේ 14 (අ) ඡේදය ප්‍රකාරව වත්කම් අයිතමයක හා ආශ්‍රිත අනාගත ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවයන් ආයතනය වෙත ගලාඒමේ හව්‍යතාවයක් ඇතිවිට ඒවා ආයතනයේ වත්කම් ලෙස හඳුනාගතයුතු වුවද අමාත්‍යාංශ ප්‍රදාන යටතේ සමාලෝචිත වර්ෂය තුළ මිලදීගෙන භාවිතාකරමින් පවතින රු.536,091,616 ක් වූ ප්‍රාග්ධන වත්කම් හා පොළොන්නරුව සෙවනපිටිය මත්ස්‍ය අභිජනනාගාරය ඉදිකිරීම වෙනුවෙන් වැයකරන ලද රු.මිලියන 238.84 ක් ප්‍රාග්ධන වත්කම් හා ඊට අනුරූප ප්‍රදාන ලෙස ගිණුම්ගතකර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 47 වගන්තිය පරිදි දේපළ , පිරියත හා උපකරණවල සාධාරණ වටිනාකම් එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වනවිට , වසර 03 කට හෝ වසර 05 කට වරක් ප්‍රත්‍යාගණනය සිදුකිරීම ප්‍රමාණවත් වුවත්, අධිකාරියේ ආරම්භක වර්ෂය වන 1998 වර්ෂයෙන් පසුව සියළුම වත්කම් වෙනුවෙන් ප්‍රත්‍යාගණන කටයුතු සිදුකර නොතිබුණි.

(iii) ප්‍රමිතයේ 64 වගන්තිය පරිදි වත්කම් සඳහා වූ ඵලදායී ජීවිත කාලය සළකා වාර්ෂික ක්ෂය අනුපාතය තීරණය කළයුතු වුවත් , එයට පටහැනිව අධිකාරිය විසින් තාක්ෂණික හේතූන් මත සීඝ්‍රයෙන් යල්පැනීමට ලක්වන පරිගණක මෘදුකාංග සහ විද්‍යාගාර උපකරණ වසර 10 ක ඵලදායී ජීවිත කාලයක් සඳහා ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි.

(iv) ප්‍රමිතයේ 90 වගන්තිය අනුව රු. 17,609,995 ක් වූ ප්‍රත්‍යාගණන සංචිත පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස හඳුනාගත යුතු මව් මත්ස්‍ය තොග ගිණුම් ගතකිරීම සඳහා ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු.1,730,759 ක මව් මත්ස්‍ය තොගය හා මව් මත්ස්‍ය ආරම්භක හා අවසාන තොග පිළිවෙලින් රු.6,714,641 ක් හා රු.7,696,600 ක් වූ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස හඳුනාගැනීම වෙනුවට විකුණුම් පිරිවැයට ගැලපීම් කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.748,801 ක් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ආ) රු.309,945 ක් වූ කිරි ගවයින් 06 දෙනෙකු ගිණුම්ගත කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධිත අගය යන අගයන් දෙකෙන් වඩා අඩු අගයට අවසන් තොග අගය කිරීම අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්තිය වුවද තොග අගය කිරීමේදී ඒවායේ ශුද්ධ උපලබ්ධිත අගය ගණනය කර පිරිවැය සමඟ සැසඳීමකින් තොරව අවසන් තොගය එහි පිරිවැය වූ රු.43,506,282 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාරිතෝෂික වෙන්කිරීම් ගණනය කිරීමේදී ගැලපීම් දීමනාව ඇතුළත් නොකල යුතු වුවද සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වෙන්කිරීම් ගැලපුම් දීමනාවද ඇතුළත්ව ගණනය කිරීම හේතුවෙන් රු.12,114,266 කින් වැඩියෙන් වෙන්කිරීම සිදුකර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අලාභයද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) අධිකාරිය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය , බස්නාහිර පළාත් ධීවර අමාත්‍යාංශය හා නාරා ආයතනය හා වෙනත් ආයතන වෙත 2010,2015,2016 වර්ෂවල පවරන ලද පිටිපන , පොළොන්නරුව ,පනාපිටිය පිහිටි රු.5,000,000 ක් වූ ඉඩම් තුනකට අදාල වටිනාකම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගිණුම් වලින් ඉවත්කිරීමට කටයුතු කර නොතිබුණි.මේ හේතුවෙන් ඉඩම් වල වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) අධිකාරියේ මධ්‍යස්ථාන ස්ථාපිත කර තිබූ ඉඩම් 18 කට අදාලව හෙක්ටයාර 114.6 ක වටිනාකම 2017 දෙසැම්බර් 31 වෙනි දිනටත් තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වසර 05 ඉක්මවන ලද ණයගැතියන් සඳහා සියයට සියයක අඩමාණ ණය , ප්‍රතිපාදන වෙන්කිරීම අධිකාරියේ ප්‍රතිපත්තිය වුවද , වසර 05 ක් ඉක්මවා ඇති මුළු අගය රු.3,286,422 ක ණයගැතියන් සඳහා සියයට සියයක අඩමාණ ණය ප්‍රතිපාදනයක් සිදුකර නොතිබුණි.

(ඉ) බැංකු සැසඳුම් ප්‍රකාශනයේ හඳුනානොගත් බැර ලෙස දක්වා තිබූ 2015 වර්ෂයේ සිට පැවතෙන එකතුව රු. 937,450ක් වූ සෘජු බැංකු බැරකිරීම් 122 ක් හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

අධිකාරියෙහි සමාලෝචිත වර්ෂය සඳහා වූ අලාභය රු.34,740,968 ක් වුවද ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයෙහි සමාලෝචිත වර්ෂය සඳහා වූ අලාභය රු.38,979,530 ක් ලෙස දක්වා තිබුණි. මේ අනුව රු.4,238,562 ක වෙනසට හේතු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

ආපදා ණය ශේෂයට අදාල ආරම්භක ශේෂ , මාසික වාරික ගණන , අයවී ඇති වාරික සහ හිඟ වාරික ශේෂ සකස්වී ඇති විස්තරාත්මක ලේඛණ පවත්වා නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.52,557,438 ක් වූ ආපදා ණය ශේෂය සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 751 | පුස්තකාලයට ලැබෙන සියලුම පොත්, පරිග්‍රහණ ලේඛන පොතෙහි ඇතුළත් කළයුතු වුවද , අධිකාරියේ පුස්තකාලයේ ඇති පොත්පත් 406 ක් හා 2017 දෙසැම්බර් 31 දිනට පරිග්‍රහණ ලේඛනවල ඇතුලත් කර නොතිබුණි. |
| (ආ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය හා 3.1.7 ඡේදය | සමාලෝචිත වර්ෂයේ එකතුව රු.310,235,285 ක වත්කම්වලට අදාළව භාණ්ඩ සමීක්ෂණය සිදුකර ඊට අදාළ වාර්තා විගණකාධිපති වෙත යොමුකර නොතිබුණි. |
| (ඇ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 371(2) (ආ) | (i) එකම කාර්යයක් සඳහා එකම දින රු.100,000 ඉක්මවමින් අවස්ථා 07 ක දී රු.1,106,785 ක් තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි.<br><br>(ii) අධිකාරිය විසින් අවස්ථා 12 කදී ලබාදුන් එකතුව රු.385,780 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදුන් දින සිට මාස 06 කට වඩා ප්‍රමාදවී නිරවුල්කර තිබුණි. |

| | | |
|---|---|---|
| | | (iii) අවස්ථා 68 කදී ලබාදුන් එකතුව රු.1,670,005 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමකළ වහාම පියවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිරවුල් කර නොතිබුණි. |
| | | (iv) අධිකාරිය විසින් 2015 වර්ෂයේ සිට බාහිර ආයතන වෙතින් භාණ්ඩ හා සේවා මිලදීගැනීමේදී මිලදී ගැනීමේ අත්තිකාරම් ලෙස අවස්ථා 77 ක දී භාණ්ඩ ලැබීමට පෙර ගෙවා තිබූ එකතුව රු.9,950,836 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) | 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.1 ඡේදය | අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ විශ්‍රාමගත් නිලධාරීන් 07 දෙනෙකුට දළ වැටුපෙහි ගැලපුම් දීමනාවද ඇතුළත්ව පාරිතෝෂික ගණනය කර ගෙවීම් කිරීම නිසා රු.351,291 ක් වැඩියෙන් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.34,740,968 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.36,533,378 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,792,410 කින් වර්ධනය වී තිබුණි. ආයතනික වියදම් රු.8,424,237 කින් වැඩි වුවද රාජ්‍ය ප්‍රදානයන් රු.8,730,921 කින් සහ විලම්භිත ආදායම් සහ රු.3,450,000 කින් වැඩිවීම ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.9,099,308 ක් වූ ඌනතාවය 2015 වර්ෂයේදී රු. 11,443,032 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණද 2017 වර්ෂයේදී නැවතත් රු.34,740,968 ක ඌනතාවයක් වී තිබුණි.කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා සේවක පාරිශ්‍රමික නැවත ගැලපීමෙන් පසුව 2013 වර්ෂයේ රු.244,794,745 ක්ව පැවති අධිකාරියේ දායකත්වය 2017 වර්ෂය අවසානයට රු.388,555,255 දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පුත්තලම දිස්ත්‍රික්කයේ කුසලබංගදෙණියහි මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා රු.මිලියන 25 ක් සහ පරා මසුන් සඳහා මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 25 ක් වෙන්කර තිබුණද , ඉන් පිළිවෙලින් රු.මිලියන 6.17 ක් සහ රු.මිලියන 9.6 හෙවත් සියයට 15 ක් සහ සියයට 5 ක් පමණක් වැයකර තිබුණද සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සහ ජලජීවී නිෂ්පාදනය වැඩිකිරීම, රැකියා අවස්ථා ජනනය කිරීම , විදේශ විනිමය වැඩිකර ගැනීම , ධීවරයන්ගේ ආදායම් ඉහළ නැංවීම ඒක පුද්ගල මත්ස්‍ය පාරිභෝජනය වැඩිකිරීමේ අරමුණින් මන්නාරම , හම්බන්තොට සහ මඩකලපුව ජලජීවී කර්මාන්ත උද්‍යාන පිහිටුවීම සඳහා රු.මිලියන 500 ක් සමාලෝචිත වර්ෂය තුළ වෙන්කර තිබුණද, ඒ සඳහා රු.මිලියන.68.16 ක් හෙවත් සියයට 13.6 ක් පමණක් වැයකර තිබුණි.වනජීවී කලාපය තුළ පිහිටි යෝජිත ඉඩම් නිරවුල් නොවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) වෙරළ තීරයේ කකුළුවන් බිහිකිරීමේ නගර ස්ථාපිත කිරීමට ගල්මුල්ල , රැකව සහ ම(ර්)ක්කේර්නි යන නගර වල ධීවර කලාප පිහිටුවීම සඳහා රු.මිලියන 100 ක් වෙන්කර තිබුණද රු.මිලියන 31.90 ක් හෙවත් සියයට 31 ක් පමණක් වැයකර තිබුණි. ඉන් රැකව ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 23.31 ක් වැයකර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු අතර අනෙකුත් ව්‍යාපෘති 02 සඳහා රු.8.59 ක් වැයකර තිබුණද පරිසර බලපත්‍ර ලබාගැනීම ප්‍රමාද වීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඈ) (i) රටතුළ මත්ස්‍ය නිෂ්පාදනය සහ පරිභෝජනය වැඩි දියුණු කිරීමේ අරමුණින් මිරිදිය කිවුල්දිය , වෙරළබඩ හා සමුද්‍රීය ජලජීවී වගාව වැඩිදියුණු කිරීම හා එමඟින් රැකියා අවස්ථා ඇතිකිරීම හා ප්‍රවර්ධනය යන අරමුණ ඉටුකරගැනීම සඳහා 2011, 2012 , 2013 සහ 2014 යන වර්ෂ වලදී දිවිනැගුම ණය යෝජනා ක්‍රමය මගින් ප්‍රතිලාභීන් 6450 ක් සඳහා රු.229,035,250 ක් ලබාදී තිබුණද එම වැඩසටහන පහත සඳහන් හේතු නිසා අසාර්ථක වී තිබුණි.

- ප්‍රතිලාභීන්ගේ ව්‍යාපෘති පිහිටි ස්ථානවලට පහසුවෙන් ළඟාවීම සඳහා අවශ්‍ය ස්ථානීය විස්තර නොවීම.
- ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී එම ප්‍රදේශවල ජල හිඟය පිළිබඳව අවධානය යොමු නොකිරීම.
- ප්‍රතිලාභීන් නිසි පරිදි පුහුණු නොකිරීම.
- ව්‍යාපෘති ආරම්භයේදී දෙන ලද පොදු උපදෙස් මාලාව අනුව “ දිවිනැගුම ” ව්‍යාපෘති හිමියන්ගේ ග්‍රාමීය සංවිධානයක් හෝ දිස්ත්‍රික් සංවිධානයක් ස්ථාපිත කළයුතු වුවද එවැනි ග්‍රාමීය හෝ දිස්ත්‍රික් සංවිධානයක් ක්‍රියාත්මක නොවීම.
- ජලජීවී වගා නිලධාරීන් විසින් පසුවිපරම් නොකිරීම.
- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගෙන යාමේදී මතුවන ගැටලුවලට උපදෙස් සහ තාක්ෂණික දැනුම ලබාදීම වෙනුවෙන් විධිමත් වැඩසටහනක් නොතිබීම.

(ii) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති වර්ග 04 ක් වෙනුවෙන් ප්‍රතිලාභීන් 140 දෙනෙකුට ගෙවීම් කර තිබුණු රු.7,561,000 මුදලින් 2017 දෙසැම්බර් 31 දින වන විට රු.3,055,375 ක් ආපසු අයකරගත යුතු වුවත් ,කිසිදු මුදලක් මේ දක්වා අයකර ගෙන නොතිබූ අතර ව්‍යාපෘති 139 කින් ව්‍යාපෘති 39 ක නියැදියක් භෞතිකව පරීක්ෂා කිරීමේදී රු.1,259,500 ක දිවිනැගුම ණය යෝජනා ක්‍රමයෙන් ගෙවීම් කර තිබුණු ව්‍යාපෘති 28 ක් වසර 02 සිට වසර 05 ඉක්මවූ කාලයක සිට අක්‍රියව පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඉ) සුන්දර තොටුපොල සංවර්ධන ව්‍යාපෘති යෝජනාව සඳහා රු.මිලියන 50 ක අමාත්‍යාංශ ප්‍රතිපාදන වෙන්කර රු.මිලියන 19.16 ක් වැයකර තිබුණද විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබීම නිසා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී ගැටළු පැනනැගී තිබූ අතර විගණිත දිනය වන විටත් සුන්දර තොටුපොල ව්‍යාපෘතියේ සමස්ත භෞතික කාර්ය සාධනය සියයට 10 ක අඩු මට්ටමක පැවති අතර කණ්ඩලම , දඹුළුඹය, මින්නේරිය යන ජලාශ 03 ක් ආශ්‍රිත තාවකාලික තොටුපල ඉදිකිරීම් පමණක් අවසන්ව තිබුණි.

(ඊ) 2017 වර්ෂයේදී දිස්ත්‍රික්ක 24 ක මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීමේ ඉලක්කය රු.මිලියන 94.36 ක් ලබාදී තිබුණද වර්ෂය තුල තැන්පත් කළ ප්‍රමාණය රු.මිලියන 79.55 ක් විය. ඒ අනුව රු. මිලියන 14.81 ක ඇඟිල්ලන් තැන්පත්කිරීමේ ඉලක්ක ළඟාකරගෙන නොතිබුණි. කෑගල්ල, මන්නාරම, නුවරඑළිය, පුත්තලම යන දිස්ත්‍රික්ක වල ළඟාකර නොගත් ඉලක්කයන් පිළිවෙලින් සියයට 40, සියයට 70, සියයට 48 හා සියයට 69 ක් විය.

(උ) පම්බල මිරිදිය ඉස්සන් වගාව වැඩිදියුණු කිරීම සඳහා වූ ව්‍යාපෘතිය සඳහා 2017 මැයි 19 දින රු.20,032,180 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ අතර කොන්ත්‍රාත් වටිනාකමින් 2017 දෙසැම්බර් 08 දින කල වැඩ සඳහා රු.13,382,238 ක ගෙවීම් කර තිබුණි. 2018 ජනවාරි 09 දින තවත් මාසයක කාල දීර්ඝ කිරීමක් ඉල්ලා තිබුණි. කෙසේ වුවද ක්‍රියාකාරී සැලැස්ම තුල මෙම ව්‍යාපෘතියේ , භෞතික හා මූල්‍ය කාර්ය සාධනය සියයට 100 ක් ලෙස දක්වා තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් භාවිතා කරනු ලබන හෙක්ටයාර 38.7526 ක ඉඩම්වල අයිතිය අධිකාරිය වෙත 2018 අප්‍රේල් 10 දින දක්වාම පවරාගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංවර්ධනය හා තිරසාර ආහාර සුරක්ෂිතතාවය ඉලක්ක කර ගනිමින් වෙරළබඩ ජලජීවී වගාව පරිසර හිතකාමී ලෙස ඉහළ නැංවීම සඳහා විභව ආයෝජකයින් මෙම ක්ෂේත්‍රය සඳහා ආකර්ෂණය කරගැනීමට සුදුසු පරිසරයක් ඇති කිරීම සහ පරිසර හිතකාමී ලෙස සිදුකරන වගා කටයුතු මගින් වෙරළබඩ හා සමුද්‍රීය ජලජීවී වගා විශේෂවල නිෂ්පාදනය වැඩිකිරීම හා ගුණාත්මක මට්ටම ඉහළ නැංවීම අරමුණු ඇතිව මන්නාරම දිස්ත්‍රික්කයේ ජලජීවී වගා කර්මාන්තපුරයක් ඉදිකිරීම සඳහා සැලසුම් කර තිබුණි. මේ සඳහා රු.මිලියන 290 ක් වෙන්කර තිබූ අතර 2016 අගෝස්තු ඉදිකිරීම් ආරම්භකර 2018 අගෝස්තු නිම කිරීමට අපේක්ෂිත විය. 2018 මාර්තු වන විට ඉඩම් මැනුම් කටයුතු, ජල පහසුකම්, ඉන්ධන හා විදේශ පුහුණුවීම් සඳහා රු.මිලියන 8 ක් වැයකර තිබුණි. මේ පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබූ අතර පාරිසරික ඇගයීම් වාර්තා මූලික පාරිසරික පරීක්ෂණ වාර්තා සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) ඒ හේතුවෙන් මන්නාරම ජලජීවී කර්මාන්තපුරය සඳහා හඳුනාගෙන ඇති ඉඩම වෙඩිකළතිව් ස්වාභාව රක්ෂිතය තුළ පිහිටා ඇති බැවින් යෝජිත කර්මාන්තපුරය ස්ථාපිත කිරීමට ප්‍රථම අදාල ඉඩම් කොටස් වනජීවී ස්වාභාව රක්ෂිතයෙන් නීත්‍යානුකූලව බැහැර කිරීමට අවශ්‍ය බවත් ඒ සඳහා වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනතේ 2(4) අ හා 2(5) වගන්ති වලට අනුව බැහැර කිරීමට යෝජිත කොටස සඳහා පාරිසරික ඇගයීමක් සිදුකල යුතු බව 2017 ජූලි 21 දින තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වා තිබුණද, 2018 මාර්තු වන විටත් ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. ඒ අනුව ජලජීවී වගා කර්මාන්තපුරයක් ඉදිකිරීමෙන් ලඟාකරගැනීමට ඉලක්ක කර තිබූ ඉහත සඳහන් අරමුණ 2018 මාර්තු වන විටත් ඉටුකරගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) 2017 වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණන වාර්තා 31 කින් ජලජීවී වගා මධ්‍යස්ථාන 08 කට අදාලව රු.1,499,541 ක ආදායම් බැංකුගත කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් එකතුවන මුදල් අනිසි පරිහරණයට යොදවාගැනීමේ හැකියාව අභ්‍යන්තර විගණන වාර්තා තුළින් කළමනාකරණයට පෙන්වා දී තිබුණද එම අඩුපාඩු මඟහරවා ගැනීමට කළමනාකරණය විසින් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**------------------------------**

වෙක්කයා මසුන් අභිජනනය කිරීම පිළිබඳ තාක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද රු.3,874,592 ක මූල්‍ය සහාය ඇතිව 2005 සැප්තැම්බර් 28 දින ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. එහෙත් ගිවිසුම ප්‍රකාර කටයුතු නොකිරීම හේතුවෙන් පෞද්ගලික සමාගම විසින් අධිකාරියට ගෙවිය යුතු වූ රු.2,581,867 ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

**----------------------------------**

අක්කර 104 ක වපසරියක් ඇති උඩවලව මිරිදිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයේ පොකුණු ඉදිකිරීමට යෝජිත ස්ථානවල පස් ඉවත්කිරීමේදී මැණික් ඉල්ලම් මතුවී තිබුණි.ආයතනය පිහිටුවීමේ අරමුණුවලින් බැහැරව අදාල අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියෙන් තොරව 2016 දෙසැම්බර් 07 දින සිට වසරක කාලයකට මැණික් ගැරීමේ කටයුතු සිදුකිරීමට මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමඟ ගිවිසුම් ගතවී තිබුණි.එම ගිවිසුම අනුව 2017 දෙසැම්බර් 05 දින වනවිට වසරක් අවසන් වී තිබුණද ගිවිසුමේ 06 වන වගන්තිය අනුව ලද මැණික් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා දරන ලද පිරිවැය අඩුකිරීමෙන් පසුව ලාභයෙන් සියයට 10 ක් අධිකාරියට ලැබිය යුතු වුවද විගණන දිනය වූ 2018 මැයි මාසය වන විටත් එකී මුදල් ලැබී නොතිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

**----------------------**

**5.1 තිරසාර සංවර්ධන ඉලක්ක ලඟාකරගැනීම**

**---------------------------------------------**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 " න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වී ඇති බව ඊට අදාල ප්‍රශ්නාවලියෙන් දක්වා තිබුණද , ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු,ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද , ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

### 6.1 අභ්‍යන්තර විගණනය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර තිබුණද, ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් රු.මිලියන 750 ක් වූ ක්‍රියාකාරකම් හතරක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර විගණන සැලසුම් සකස්කර නොතිබුණි.

(ආ) ආයතනයේ සැලසුම්ගත අරමුණු ඉලක්ක , මෙහෙවර හා දැක්ම ඉටුකරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාවලිය සම්බන්ධයෙන් විධිමත් ඇගයීමක් සිදුකර එය ප්‍රශස්ත මට්ටමක පවත්වාගෙන යාමට අවශ්‍ය පුහුණු කාර්ය මණ්ඩලය අභ්‍යන්තර විගණන අංශය වෙත ලබාදී නොතිබුණි. මේ හේතුවෙන් අධිකාරියේ ඉදිකිරීම් හා අධිකාරියේ අරමුණුවලට ලඟාවීම සම්බන්ධයෙන් වූ වැඩසටහන් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු වී නොතිබුණි.

### 6.2 විගණන කමිටු

----------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාරව මාස තුනකට වරක් විගණන කමිටු රැස්වීමක් පැවැත්විය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද එම කමිටු තීරණ ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම දුර්වල මට්ටමක පැවතුණි.

### 6.3 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

-----------------------------------------

#### 6.3.1 ප්‍රසම්පාදනයන්

----------------

කහමෝදර මිරිදිය ඉස්සන් අභිජනනාගාරය ඉදිකිරීමට අදාල අදියර II හා III හි කොන්ත්‍රාත් පිළිබඳ පරීක්ෂාවේදී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය වූ අතර ඒවා පහත පරිදි වේ.

(අ) ඡේද අංක 4.3.2 ට අනුව ඉංජිනේරු ඇස්තමේන්තුව අධිකාරියේ සභාපතිවරයා සහ අමාත්‍යාංශ ලේකම් අනුමත කර නොතිබුණි.

(ආ) ඡේද අංක 8.9 ට අනුව රු.500,000 ට වැඩි සවිකිරීම් වෙනුවෙන් සේවා ගිවිසුම් අත්සන්කල යුතු වුවත් රු.1,200,000 ක් වටිනා අයිතම දෙකක් කහදමෝදර මධ්‍යස්ථානයේ සවිකිරීම වෙනුවෙන් සේවා ගිවිසුම් වලට ඇතුළත් වී නොතිබුණි.

(ඇ) ඡේද අංක 8.14.1 ට අනුව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා ප්‍රසම්පාදන අස්ථිත්වය සෑහීමකට පත්වන පරිදි තහවුරු කිරීම් ලබාගෙන නොතිබුණි.

(ඇ) ඡේද අංක 8.13.4 හි 6.7 වගන්තියට අනුව කහදමෝදර මිරිදිය ඉස්සන් අභිජනනාගාරයේ ඉදිකිරීම් පරීක්ෂාවේදී වැඩිවූ අතිරික්ත වැඩ වටිනාකම වන රු.3,339,443 ක් වැඩිවීම වෙනුවෙන් අදාල වගකිව යුතු නිලධාරියා විසින් හේතු පැහැදිලි කර නොතිබුණි.

**6.3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉඟිනියාගල ජලජීවී වගා මධ්‍යස්ථානයේ මත්ස්‍ය පොකුණු 10 ක් ඉදිකිරීම සඳහා රු.54,869,808 ක් වූ කොන්ත්‍රාත්තුවට අදාල ලංසු ඇගයීම් නිර්නායක අනුව පසුගිය වසර 05 ක ඉදිකිරීම් කොන්ත්‍රාත් සම්පූර්ණ කිරීම සලකා බලන බව දක්වා තිබුණද 2012 වර්ෂයේ වැඩ අවසන් කරන ලද එක් කොන්ත්‍රාතුවක් පමණක් සලකා බලා තිබුණි. ඒ අනුව පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2016 අගෝස්තු 23 දින ආරම්භ කර දින 180 කින් එනම් 2017 පෙබරවාරි 23 දින නිම කළයුතුව තිබූ කොන්ත්‍රාත්තුව, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කොන්ත්‍රාත් පරිපාලනය නිසා 2017 මාර්තු 30 වන විටත් සියයට 32 ක් වැනි අවම කාර්යසාධන මට්ටමක් වාර්තා කර තිබූ අතර කොන්ත්‍රාත් කාලය අවසන් වී මාස 04 ½ ක් ගතවීමෙන් පසු අනුචිත ලෙස කාල දිගුකිරීම් ලබාදී තිබුණි. එසේ වුවද යළි ඉදිකිරීම් කටයුතු සිදුකිරීමට කොන්ත්‍රාත් සමාගම අපොහොසත් වීම නිසා 2017 නොවැම්බර් 08 දින කොන්ත්‍රාත්තුව අත්හැර තිබූ අතර රු.18,706,835 ක ගෙවීම් සිදුකර තිබුණි.

(ii) ගිවිසුම් පරිදි කොන්ත්‍රාත් කටයුතු අවසන් නොකිරීම නිසා මත්ස්‍ය පොකුණු 10 කින් ඉලක්ක කර තිබූ රු.4,800,000 ක් වූ වටිනාකමින් යුතු ඇසිත්තන් නිෂ්පාදනයක් සහ රු.2,400,000 ක් වූ වටිනාකමින් යුතු ඇඟිල්ලන් නිෂ්පාදනයක් අධිකාරියට අහිමි වී තිබුණි.

(ආ) රු.මිලියන 50 ක අමාත්‍යාංශ ප්‍රතිපාදන මගින් දියත් කරන සුන්දර තොටුපල සංකල්ප ව්‍යාපෘතිය යටතේ ඉදිකරන එක් තොටුපොලකට ආසන්න වශයෙන් රු.මිලියන 2.8 ක වියදමක් දැරීමට සිදුවන තාවකාලික කන්ටේනර් සහිත ජංගම ධීවර විවේකාගාර, වාරිමාර්ග හෝ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු අවශ්‍යතාවයකදී කොන්දේසි විරහිතව ඉවත්කරගැනීමට අධිකාරිය බැඳී සිටින බැවින් රක්ෂිත කලාපයන්හි ඉදිකරන ලද මෙම තාවකාලික ඉදිකිරීම් යම් අවශ්‍යතාවයකදී ඉවත්කරගැනීමට සිදුවුවහොත් එම ඉදිකිරීම් සඳහා දරන ලද වියදම් නිෂ්කාර්ය වියදම් බවට පත්වීම බැහැර කල නොහැකි අවධානමක් පවතී. කන්ටේනර් ශාලා සවිකිරීම සඳහා 2017 වර්ෂය අවසානය වනවිට රු. 7,573,730 ක අත්තිකාරම් ගෙවීමක් සිදුකර තිබුණි.

(ඇ) පොළොන්නරුව - සෙවනපිටිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රජරට නවෝදය ජනපති වැඩසටහන 2016 – 2018 පිබිදෙමු පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 430 ක් වෙන්කර තිබුණි. කාර්යාල ගොඩනැගිලි , නිලධාරී නිල නිවාස , ජල සංචිත ටැංකිය හා ජල සැපයුම් පද්ධතිය ඇතුළු අංග සම්පූර්ණ අභිජනන මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා ඉඩමේ යෝග්‍යතාවය තහවුරු කරගැනීමට ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් සකස්කිරීමෙන් තොරව ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණි.

(ඈ) කහඳමෝදර මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථානය අදියර 03 ක් යටතේ ඉදිකිරීම සඳහා රු.29,641,017 ක අගයකට ඇස්තමේන්තු සකස්කර තිබුණි. ඒ අනුව තෝරාගත් පෞද්ගලික ඉංජිනේරු ආයතනයක් සමඟ රු.24,201,680 ක් සඳහා කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණද අදියරයන් 03 සඳහා කළවැඩ වටිනාකම රු.33,804,849 ක් ගෙවා තිබුණි. එකී ගෙවීම් තුළ ඉටුනොකළ වැඩ සඳහා ගෙවීම් කිරීම හා අදාල පිරිවිතරයන්ට අනුකූල නොවීම් හේතුවෙන් රු.2,815,123 ක වැඩිපුර ගෙවීම් සිදුකර තිබුණි.

(ඉ) උඩවලව නව මත්ස්‍ය අභිජනනාගාරයක් සහ තිලාපියා අභිජනන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් සඳහා පිළිවෙලින් රු.මිලියන 84.5 ක් සහ රු.මිලියන 7.27 ක් වැයකිරීමට ඇස්තමේන්තුකර තිබුණද ප්‍රසම්පාදන සැලැස්මෙන් බැහැරව පිළිවෙලින් රු.මිලියන 150.3 ක් සහ රු.මිලියන 17.8 ක් සඳහා ගිවිසුම් ගතවී ඉදිකිරීම් කර තිබුණි.

### 6.3.3 ප්‍රමාද වූ ව්‍යාපෘති

2017 වර්ෂයේ දඹුල්ල මත්ස්‍ය ජාන සංවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 50 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන්වී තිබූ අතර, රු.47,153,130 ක් ලැබී තිබුණි. ඒ යටතේ මත්ස්‍ය ජාන විද්‍යාගාරයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 17 ක කොන්ත්‍රාත් වටිනාකමකට 2017 ජුනි 02 කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබූ අතර 2017 වර්ෂයේ දෙසැම්බර් 31 වනවිට ඉදිකිරීම් නිමකිරීමට නියමිතව තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට , කෙරීගෙන යන තත්ත්වයේ පැවතුණි.

### 6.4 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

කහඳමෝදර මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථානය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2017 මාර්තු 14 දින සිට 2020 මාර්තු 13 දක්වා ලබාදී තිබූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ 2.1 වගන්තිය පරිදි මෙම නිෂ්පාදන ක්‍රියාවලිය තුළින් ජනනය වන අප ජලය පිරිසිදුකර පරිසරයට මුදාහැරිය යුතුවේ. ඒ අනුව මෙම මධ්‍යස්ථානයේ අපද්‍රව්‍ය පිරිසිදුකරන ස්ථානයක් පිහිටුවා තිබුණද විගණන පරීක්ෂාව සිදුකරන අතරතුරදී අංක B දරන අභිජනන මධ්‍යස්ථානයෙන් බැහැරකරන අපජලය පිරිසිදුකරන ස්ථානය හරහා නොගොස් වෙනම නළ මාර්ගයක් ඔස්සේ කලපුව වෙත මුදාහරිමින් පැවතුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුව ඇත.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය කළමනාකරණය | ඍජු බැංකු තැන්පත් හඳුනාගැනීමට කටයුතු නොකිරීම, ණය ලබාදීමේදී ණයගැති පාලන ගිණුම් නඩත්තු නොකිරීම හා පසුවිපරම් නොකිරීම. |
| (ආ) මෙහෙයුම් පාලනය | (i) මුදල් රෙගුලාසි 485 අනුව රජයේ නිලධාරීන්ට ණය අත්තිකාරම් ලබාදීමේදී උපයෝගී ලේඛනයක් පවත්වා නොතිබීම. |
| | (ii) මිලදීගැණුම් අත්තිකාරම් 2015 වර්ෂයේ සිට නිරවුල් කර නොතිබීම. |
| | (iii) මිලදී ගැනීම හා ගෙවීම් අතර අභ්‍යන්තර පරීක්ෂාවන් සිදුවන පරිදි වැඩ බෙදීමක් සිදුකර නොතිබීම. |
| | (iv) අයකරගතයුතු වාරික අයකර නොතිබීම , ණය ලේඛන හා ලිපිගොනු යාවත්කාලීන නොකිරීම. |

| | |
|---|---|
| | (v) ප්‍රතිලාභීන් තෝරාගැනීම හා පුහුණු වීම් දුර්වල තත්ත්වයක පැවතීම. |
| | (vi) නිලධාරීන් විසින් පසු විපරම් කටයුතු සිදුකර නොතිබීම. |
| | (vii) පොදු උපදෙස් මාලාව අනුව කටයුතු නොකිරීම. |
| | (viii) ව්‍යාපෘතියේ අරමුණ වන ධීවර ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සිදුවී නොමැතිවීම හා ව්‍යාපෘතිය අසාර්ථක වී තිබීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පාලනය | කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |
| (ඉ) අභ්‍යන්තර විගණනය | ප්‍රමාණවත් සහ සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලයක් පවත්වාගැනීමට කටයුතු නොකිරීම. |
| (ඊ) කොන්ත්‍රාත් පාලනය | (i) කාලය දීර්ඝ කිරීමේදී ප්‍රසම්පාදන උපදෙස් අනුව කටයුතු කර නොමැකි වීම හා ඊට අදාල සාක්ෂි නොමැති වීම. |
| | (ii) ලිපිගොනු පවත්වාගෙන යාමේදී අවශ්‍ය තොරතුරු ඇතුළත් නොකිරීම හා ලිපිගොනු යාවත්කාලීන නොකිරීම. |
| | (iii) අවශ්‍ය අනුමැතීන් ලිපිගොනු තුළ ඇතුළත් නොකිරීම. |